
# යුක්තිය උදෙසා පීඩා විඳින්නන් සමග චතාරිකය



## චතාරික ආධ්‍යාත්මික වැඩසටහන 2024


යුක්තිය, සාමය හා මානව සංවර්ධන පිළිබඳ ජාතික කතෝලික කොමිසම

කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක්

# කවරයේ කථාව

සියලු ම කිතුණුවෝ චතාරික සමය පුරාම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීමේ අර්ථය සොයන්නට වෙහෙසෙති. ජේසු සමිඳුන් මේ පොළොව මත ජීවත්වූවේ ඉතා කෙටි කාලයකි. උන්වහන්සේ හඬක් නැති පීඩිතයන් වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටි සේක. උන්වහන්සේ මේ මිහිමත යුක්තිය සහ සාමය ස්ථාපිත කරනු වස් මහා ජීවිත පරිත්‍යාගයක් කළ සේක. උන්වහන්සේ කිසි විටකත් නිෂ්ඵල ලෙස දුක් වින්දේ නැත. එනමුත් උත්තරීතර අරමුණක් වෙනුවෙන් දුක් විඳි සේක.

අහිංසක මිනිසුන් 270 කට අධික පිරිසකගේ ජීවිත බිලිගත් 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් වෙනුවෙන් යුක්තිය සෙවිම සඳහා ඔවුන් සමග සිටගැනීම අපේ වගකීම යි. මෙම බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත් සියලු ම දෙනා තම ජීවිත පරිත්‍යාග කලේ මිනිසාගේ ගෞරවය නොතැකූ ප්‍රජාතන්ත්‍ර විරෝධි පාලකයන් හේතුවෙනි. එහෙත් ඔවුන් කළ අපරාධය පිළිගැනීමට තවමත් ඔවුන් අපොහොසත් වී ඇත. එලෙසම වසර 30කට අධික යුද්ධය නිසා පීඩාවට පත් ව සත්‍යය, සාධාරණත්වය සොයා යන උතුරු නැගෙනහිර දමිළ ජනතාවගේ අඳෝනාවන් තවමත් ඇසේ. ඔවුන්ගේ යුක්තිය සෙවීමේ වෙහෙසකර ගමන තව ම හමාර වී නොමැත.

තම එකම පුත්‍රයාණන් අයුක්ති සහගත ලෙස කුරුසපත් කළ විට ශක්තිමත් ව නැගී සිටියා වූ දේව මාතාවනි, වත්මන් අයුක්ති සහගත තත්ත්වයන් හමුවේ අපව ද ශක්තිමත් කළ මැනව!

සත්‍යය ඔබව නිදහස් කරයි යනුවෙන් පැවසූ ජේසු සමිඳාණෙනි මෙකී සෑම සිද්ධියකට ම සත්‍යය අපට අනාවරණය කරමින් උතුරේත් දකුණේත් වින්දිතයන් වන අප නිදහස් කළ මැනව!

ගරු දීපා ප්‍රනාන්දු පැවිදි සොයුරිය
කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක්

චතාරික ආධ්‍යාත්මික වැඩසටහන - 2024

# යුක්තිය උදෙසා පීඩා විඳින්නන් සමඟ චතාරිකය

දින 40 සඳහා භාවනා අත්වැල

ප්‍රකාශනය : කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක් ආයතනය

අනුමැතිය: ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව

# දින 40 චතාරික භාවනාවට පෙර වදනක්

අසීසියේ ශු. ෆ්‍රැන්සිස් මුනිතුමා කුරුසියක් හැඩැති දුඹුරු පැහැති ලෝගුවකින් සිය විළි වසාගත්තේත්, සිටුවර පියාණන්ගේ මුදලින් ඇඳහුන් නිළ ඇඟලුම් ගලවා විසිකර දැමීමෙන් පසු බව අපි දනිමු. එකී නිළ ඇඟ පැළඳුම් ගලවා උන්වහන්සේ සිය නිරුවතින් අපට කියා පෑවේ හිස් බවේ ශුභාරංචියයි. දිළිඳු බවේ ශුභාරංචියයි; අත් හැරීමේ ශුභාරංචියයි.

එකී ශුභාරංචිය තුළ මාංශගතවන්නට අසීසියේ ශු. ෆ්‍රැන්සිස් මුනිතුමා කුරුසියක් හැඩැති ලෝගුවක් දුඹුරු පැහැයෙන් නිර්මාණය කර ගත්තේ, මහා ගැඹුරු ආධ්‍යාත්මික යතාර්ථයක් නිරන්තරයෙන් උන්වහන්සේටම යළි යළිත් සිහිගන්වා ගැනීමේ අටියෙනි. දුඹුරු පැහැති රෙදි කඩෙන් දූවිල්ලෙන් සෑදූ මිනිසා යළි දූවිල්ලට හැරෙනා බවත් තම කම නසා කුරුසිය දරා ස්වර්ගය බලා මහ පොළව මත වන්දනා ගමනක යෙදෙන බව කුරුසිය හැඩයෙන් නිර්මාණය වූ ලෝගුවෙනුත් අසීසියේ ශු. ෆ්‍රැන්සිස් තුමා අපට කතා කරයි.

එබැවින්, අප අරඹන්නේ දින හතලිහක වන්දනා ගමනකි. නෝවාගේ ජල ගැල්මෙන් මහා පෙළොවේ පාපය සේදීමට ගත වූ දින හතලිහත්, මෝසෙස් තුමා ඉශ්රායෙල් ජනතාව වහල් බවින් නිවහල් බව කරා රතු මුහුද දෙබෑ කරමින් මන්නා අනුභව කරමින් අවුරුදු හතලිහක් දෙපයින් ගිය නික්මයාමේ ගමනත් ජේසුස් වහන්සේ පාළුකරයේ සාතන් සමඟ අරගල කරමින් ගතවූ දින හතලිහත් යටිහිතේ සඟවාගෙන හැම චතාරිකයක් ම අපට ඇරයුම් කරන්නේ ජීවිත වෙනසක් අත්දකින්නටයි.

බයිබලීය ඉතිහාසය තුළ විවිධාකාර වූ ඛේදජනක සිද්ධීන් හරහා දෙවිපියාණෝ උන්වහන්සේගේ පුදුමාකාර සැලැස්ම අනාවරණය කළ සේක. කඳුලේ උපන් සමිදාණන් කැඩුනු බිඳුනු සිත් සතන් තුළින් සිය ගැළවීමේ සැලැස්ම සමාප්තියට රැගෙන ආ අයුරු පුදුමාකාරය.

එවැනි ඛේදජනක සිදුවීම් හරහා වර්ථමානයේ ද දෙවියන් වහන්සේ යළි යළිත් අපට අනාවරණය වන සේක. උතුරු නැගෙනහිර 30 වසරක යුධ සාපයත් පස් වරසකට පෙර පාස්කු ඉරුදින සිදු වූ ම්ලේච්ච ප්‍රහාරයෙන් අපට ඇරයුම් කරන්නේ ඇදහිල්ලේ ගැඹුර සොයා කුරුසියේ සතුට සොයා, මරන්නට බැරි ජීවිතය සොයා විමුක්තියේ පෙර රසයක් ලබන්නට යි.

අළු කුරුසියක් නළලේ ඇඳගනිමින් අප අරඹන මෙම දින හතලියේ ඥාණකාන්තිය අපගේ ජීවිත කුරුස ගැන ගැඹුරින් මෙනෙහි කරන්නට අපව යොමු කරවයි. කුරුසිය යනු, අපගේ ජීවිතය යි. කුරුසිය යනු අපගේ අධ්‍යාත්මය යි. කුරුසිය යනු අපගේ අනන්‍යතාවය යි. කුරුසිය යනු අපගේ ජීවිත ක්‍රමය යි, කුරුසිය යනු අපගේ ධර්මය යි. කුරුසිය යනු අපමයි.

ශු. ජෝන් මේරි වියානි පියතුමා පවසන පරිදි, මිනිසා නිර්මාණය කර ඇත්තේ කුරුසියේ හැඩයට යි. එල්ලුම් ගහක් වූ කල්වාරි කුරුසිය, ජීවන වෘක්ෂයක් වූයේත්, සාපයක් වූ කල්වාරි කුරුසිය ආශිර්වාදයක් වූයේත්, මරණයේ සළකුණ ජීවනයේ දොරටුව වූයෙත් අප සමිදාණන් එම කුරුස ගස සිය පූජාසනය බවට හරවා වැළඳගත් නිසා ය.

එසේනම් එතෙර වෙමු. මරණින් ජීවිතයට, අඳුරින් එළියට, වහල් බවින් නිවහල් පැවැත්මකට.

ගරු ප්‍රසාද් හර්ෂන පියතුමා
කොළඹ අගරදගුරු පදවිය



# පටුන


ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ
ගරු සභාපතිතුමන්ගේ පණිවුඩය 1
- අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්

යුක්තිය, සාමය හා මානව හිමිකම් පිළිබඳ ජාතික
කොමිසමේ ගරු සභාපතිතුමන්ගේ පණිවුඩය 2
- අති උතුම් ජස්ටින් ඥානප්‍රගාසම් හිමිපාණන්

කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක් ආයතනයේ
ජාතික අධ්‍යක්ෂකතුමාගේ පණිවුඩය 4
- ගරු ලූක් නෙල්සන් පියතුමා

අළු බදාදා දින භාවනාව 6
- ගරු සිරිල් ගාමිණී පියතුමා

චතාරික සමයේ පළමු ඉරුදින භාවනාව 8
- ගරු විලියම් ඉවාන්ස් පියතුමා

චතාරික සමයේ දෙවන ඉරුදින භාවනාව 10
- ගරු ඇලෙක් රෝයි ප්‍රනාන්දු පියතුමා

චතාරික සමයේ තෙවන ඉරුදින භාවනාව 13
- ගරු ඇල්වින් පීටර් ප්‍රනාන්දු පියතුමා

චතාරික සමයේ සතරවන ඉරුදින භාවනාව 16
- ගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමා

චතාරික සමයේ පස්වන ඉරුදින භාවනාව 18
- ගරු ප්‍රසාද් හර්ෂන පියතුමා

ගොබ් ඉරුදින භාවනාව 20
- ගරු ඇන්ටන් ශ්‍රියාන් පියතුමා

මහ සිකුරාදා දින භාවනාව 22
- ගරු චාර්ල්ස් හේවාවසම් පියතුමා

පාස්කු ඉරුදින භාවනාව 24
- ගරු සාගර ප්‍රිශාන්ත පෙරේරා පියතුමා

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිත අත්දැකීම 26

යුද ගැටුම්වල පීඩිත අත්දැකීම 27

**ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ සභාපති**
**අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්ගේ**
**චතාරික පණිවුඩය**

## යුක්තිය උදෙසා පීඩා විඳින්නන් සමඟ චතාරිකය

(චතාරික සමය පුරා ජාතික යැදුමකට ආරාධනා කරමු.)

මෙය ප්‍රසාද ජනක කාලය යි. මෙය ගැලවීමේ දවස යි. සුපුරුදු පරිදි 2024 වර්ෂයේ ද චතාරික සමයට අප පියවර තබා ඇත. මේ සමය තුළ අප මතකයට නිතැතින් ම නැඟෙන්නේ ජෝවෙල් දිවැස්ප්‍රසාදිවරයාගේ “වත ඉරාගෙන නොව සිත ඉරාගෙන මා වෙතට එන්න”, යන දෙව් වදන් ය. ජේසු සමිඳාණන්ගේ දුක්ප්‍රාප්තියට සහභාගිවීම මඟින් උන්වහන්සේගේ වරප්‍රසාද සහ ගැලවීම ලබාගැනීමට මේ ප්‍රසාද ජනක කාලයේ දී අපට ආරාධනා කරයි.

සැබෑ පාස්කුවක් තුළ එතෙරවීමක් අත්දැකීමට අප උත්සුක විය යුතු ය. මෙහිලා වැදගත් වන කරුණු කිහිපයක් පිළිබඳ ව අප අවධානය යොමු කරමු. විශේෂයෙන් මේ වසර වන විට ම්ලේච්ඡ පාස්කු ප්‍රහාරයට වසර 05ක් ගතවෙයි. බලවතුන්ගේ දුෂ්ඨකම නිසා පීඩාවට පත් වූ අපේ ම සහෝදර, සහෝදරියන්ට එසේ නොමැති නම් මේ මහා ඛේදවාචකයෙන් පීඩාවට පත් අපේ ම සහෝදර, සහෝදරියන්ට යුක්තිය ඉල්ලා අපි නිරතුරුව ම මොරගසන්නෙමු.

තවත් පසෙකින්, කිසිදා අපට අමතක නොවන තිස් වසරක කුරිරු යුද්ධයෙන් පීඩාවට පත් මෙන් ම, අවතැන් වූ අප දේශයේ උතුරු, නැඟෙනහිර ජනතාවට ද සාධාරණයක් මෙතෙක් ඉටුවී ඇත්දැ යි සැක සහිත ය. ආගිය අතක් නැති තම සෙනෙහෙවන්ත තරුණ දූ පුතුන් යළිත් කවදා හෝ තම නිවස කරා පැමිණෙනු ඇතැ යි ඉදිකඩ ලඟ හඬා වැලපෙන උතුරේ මව්වරුන්ගේ අඳෝනාව තවමත් අපට ඇසේ. තව ද, අප දේශයේ අභිරහස්‍යමය ලෙස ඝාතනය කළ හෝ හිතා මතා ම අවතැන් කරන ලද හෝ පුද්ගලයන් පිළිබඳ නීතිමය තීන්දු ප්‍රමාදය අනුවේදනීය වේ.

මේ සා අසාධාරණකම්, දූෂණ, අපරාධ, අරගල හා ආර්ථික බිඳවැටීම් යනාදි අර්බුද හමුවේ අප අදහන දෙවිඳුන්ගේ ම බලවත් මැදහත්කම තුළ සාධාරණය ඉටුවනු ඇතැ යි දෑස් අයා බලා හිඳිමු. මේ චතාරික සමය තුළ දෛනික ව ඒ වෙනුවෙන් දෙවිඳුන්ට කන්නලව් කරමු, යාච්ඤා කරමු.

කිතු සමිඳුන් තුළ,

**අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා**
වයඹ පළාත්-කුරුණෑගල කතෝලික රාජගුරුප්‍රසාදීන් වහන්සේ සහ
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ ගරු සභාපති

## යුක්තිය සාමය හා මානව හිමිකම් පිළිබඳ ජාතික කතෝලික කොමිසමේ සභාපති අති උතුම් ජස්ටින් ඥානප්‍රගාසම් හිමිපාණන්ගේ චතාරික පණිවුඩය

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ මා ප්‍රිය සහෝදර සහෝදරියනි,

2024 වසරේ චතාරික ධර්ම චාරිකාව ආරම්භ කරන්නට සැරසෙන මෙම සමයේ දී අපගේ යාච්ඤාශීලි පසුතැවිල්ලන් පරිවර්ථනයක් බලාපොරොත්තු වන සැදැහැවතුන් වන්නැයි ආත්මයාණෝ අපට ආරාධනා කරන සේක.

චතාරික කාලය තුළ කිතුනුවන් ලෙස අපගේ ස්වාමින් වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් ගැන මෙනෙහි කරමින් දෙවියන්ට වඩ වඩාත් සමීපවීමේ මාර්ගයක් ලෙස නිරාහාර ව සිටීම, යාච්ඤාව හා දානය වැනි පිළිවෙත්වල නිරත වෙමු. එමඟින් මෙම දින 40 ආශිර්වාදිත හා අර්ථාන්විත කාලයක් කරගන්නට ඇරයුම් ලබමු.

"එසේ නම්, නුඹ රජෙක් දැ" යි උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, ''මම රජෙක් යයි ඔබ ම කියන්නෙහි ය. මා උපන්නේත්, ලොව පහළ වූයේත්, සත්‍යයට සාක්ෂි දරන පිණිස ය. සත්‍යයෙහි පිහිටි සියල්ලෝ මාගේ හඬ අසති" යි වදාළ සේක. (ජොහාන් 18:37)

2024 සඳහා අපගේ චතාරික තේමාව වන්නේ "යුක්තිය උදෙසා පීඩා විඳින්නන් සමඟ චතාරිකය". වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින නිතීය, පාලන තන්ත්‍රය, යුක්තිය පිළිබඳ ගැටළු නොඇසූ සේ කටයුතු කරන බව පෙනේ.

උතුරු, නැගෙනහිර දෙමළ ප්‍රජාව තවමත් තම ආදරණීයයන් වෙනුවෙන් සත්‍යය හා යුක්තිය පතා සිටින බව අප ඔබ දන්නා කරුණකි. යුද්ධයෙන් ඇති වූ තුවාල සංහිඳියාව තුළින් සුව වෙමින් පවතින අතර අද වන විට ඔවුන් එම තුවාල සඟවා ගෙන සත්‍යය හා යුක්තිය සොයමින් ගමනක යෙදේ.

මාර්ටින් ලූතර් කිං විසින් ලියන ලද "1963 බර්මින්හැම් බන්ධනාගාරයේ සිට" යන ලිපියේ පවසනුයේ, "නිදහස" කිසි විටෙකත් පීඩකයා විසින් ස්වේච්ඡාවෙන් ලබා නොදෙන අතර, එය පීඩිතයා විසින් ඉල්ලා සිටිය යුතු ය" යන්න යි. තම අයිතිවාසිකම් සම්පූර්ණ වූ පසු කෙනෙකුට සම්පූර්ණ නිදහස භුක්ති විඳිය හැකි ය. තව ම අභිරහසක් ව පවතින 2019 පාස්කු ත්‍රස්ත ප්‍රහාරය සහ එහි වින්දිතයන් වෙනුවෙන් තවමත් ශ්‍රී ලංකා කතෝලික සභාව යුක්තිය ඉල්ලා සිටී. එමඟින් අප බලාපොරොත්තු වනුයේ සත්‍යය නැමති ආලෝකය තුළින් මුළු මහත් ජාතිය ම ආලෝකමත් වීම යි. එබැවින්, පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය හා ශ්‍රී ලංකාවේ විවිධ වූ ජන වර්ග, යුද ගැටුම් නිසා පීඩා විඳින සියලු ම වින්දිතයන්ට යුක්තිය උදාවේවා යි ආයාචනා කරමින් මෙම ශුද්ධ වූ චතාරික සමයේ අපි දැඩි ලෙස යාච්ඤා කරමු.

මෙම චතාරික සමයේ දී ශක්තිමත් ඇදහිල්ලකින් ආධ්‍යාත්මික ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමෙන්, ඔබේ යාච්ඤා ජීවිතය වැඩි වර්ධනය කර ගනිමින් සහ ඔබ කෙරෙහි දෙවියන් වහන්සේගේ ඉමහත් ප්‍රේමයට විවෘත වෙමින් කල් ගෙවන්න. උන්වහන්සේගේ හඬට සවන් දී, ඒ හඬට අවනත වෙමින් එය අනුගමනය කරන්න, අළු බදාදා අපේ නළල මත තවරා ඇති අළු කුරුසිය මඟින් මතක් කරනුයේ, අපි මැරෙන අය බවත්, නැවත නව ජීවිතයකට නැඟී සිටිය යුතු බවත් ය. අපගේ ජීවිත කුරුසිය රැගෙන යන විට, අභියෝගවලට මුහුණදීම, පරීක්ෂාවන් ජය ගැනීම සහ දෙවියන් වහන්සේගේ කැමැත්තට කැප වී සිටීම පිළිබඳ ව පූර්වාදර්ශය ජේසුස් වහන්සේ ව අනුගමනය කිරීම තුළින් ලබා ගනිමු.

මෙම චතාරිකයේ ඔබට කරුණාව හා ජීවිතයේ නැවුම් භාවය තුළින් දෙවියන් වහන්සේගේ නිමක් නැති ප්‍රේමය පිළිබඳ ශක්තිමත් හැඟීමක් ගෙන එනු ඇතැ යි මම බලාපොරොත්තු වෙමි. ප්‍රීතිමත් පාස්කු උත්සවයට සූදානම් වන අපට, ක්‍රිස්තුස් වහන්සේගේ සමාදානය නොමඳ ව ලැබේවා.

**අති උතුම් ජස්ටින් ඥානප්‍රගාසම් රදගුරුතුමා**

**සභාපති**

**යුක්තිය, සාමය හා මානව සංවර්ධන ජාතික කතෝලික කොමිසම**

## කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක් ආයතනයේ
## ජාතික අධ්‍යක්‍ෂක
## ගරු ලූක් නෙල්සන් පියතුමාගේ
## චතාරික පණිවුඩය

කරිටාස් ශ්‍රී ලංකා ජාතික ආයතනයේ සාමය සහ මානව සංවර්ධනය සඳහා වූ කතෝලික ජාතික කොමිසම (SEDEC), චාතාරික සමයේ ඉරිදා මෙනෙහි කිරීම් සඳහා මෙම ආධ්‍යාත්මික පොත් පිංච සම්පාදනය කර ඇත. 'යුක්තිය උදෙසා පීඩා විඳින්නන් සමඟ චතාරිකය' යන තේමාවෙන් පෙන්නුම් කරන්නේ ආන්තික ප්‍රජාවන්ගේ දුෂ්කරතා ගැන සැලකිලිමත්වීම සහ අවබෝධ කර ගැනීම සහ දේවල් සාධාරණ කිරීමට ක්‍රියාශීලී ව කටයුතු කිරීම වැදගත් වන ආකාරය යි.

''සෙවිල්ල" යන යෙදුම පොදුවේ දෙවියන් වහන්සේ සෙවීම, ප්‍රඥාව, හරි දේ කිරීම හෝ සත්‍යය සෙවීම ගැන කතා කරන බොහෝ බයිබල් පද සමඟ සම්බන්ධ වේ. බයිබලයේ, අපි සෙවීම ගැන කතා කරන විට, එය සාමාන්‍යයෙන් අදහස් කරන්නේ ක්‍රියාශීලී ව හා අවංක ව යමක් සෙවීම යි. නිදසුනක් වශයෙන්, ශුද්ධ ලියවිල්ල පවසන්නේ, ''ඉල්ලන්න, එවිට ඔබට එය ලැබෙනු ඇත; එය සොයන්න, එවිට ඔබට එය සම්භ වනු ඇත; තට්ටු කරන්න, එවිට දොර විවෘත වනු ඇත. ඔබ ඉල්ලුවහොත් ඔබට ලැබෙනු ඇත, ඔබ සොයන්නේ නම්, ඔබ සොයා ගනීවි; ඔබ තට්ටු කළහොත් දොර විවෘත වනු ඇත" වශයෙනි (ලූක් 11:09-10). මිනිසුන් සැමවිට ම සත්‍යය නොදන්නවා විය හැකි ය, නමුත් දෙවියන් වහන්සේ සැමවිට ම දන්නා අතර, එතුමන්ට සියල්ල පැහැදිලි ය. එම නිසා, දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන්නේ අවශ්‍යතා සඳහා උන් වහන්සේ වෙතට ගොස්, පිළිතුරක් සඳහා උන් වහන්සේ සොයා යන ලෙස යි.

යුක්තිය පිළිබඳ කතෝලික සභාවේ ඉගැන්වීම්වලට පසුබිම ලබාගන්නේ සභාවේ සමාජ ඉගැන්වීම් තුළින් වේ. මෙම ඉගැන්වීම්වල කතෝලිකයන්ට සමාජ සාධාරණත්වය සහ සත්‍යය අවබෝධ කර ගැනීමට උපකාර වන මූලධර්ම ඇතුළත් වේ. සමාජ සාධාරණත්වය තීරණාත්මක වන ආකාරය සහ ශුභාරංචියට අනුව ජීවත්වීමේ ප්‍රධාන අංගයක් ලෙස සලකන ආකාරය

සභාව විසින් ඉස්මතු කරයි. ශ්‍රී ලංකාවේ යුද වැන්දඹුවන් සහ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත් වූවන් ගැන කතා කිරීම, ඔවුන්ගේ දුෂ්කරතා තේරුම් ගැනීමට සහ ඔවුන් වෙනුවෙන්, සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටීමට කැපවීම යි. 2024 චතාරික සමයේ දී, පීඩිත ප්‍රජාවන් සඳහා සත්‍යය සහ යුක්තිය වෙනුවෙන් දැඩි ලෙස යාච්ඤා කරන ලෙස රටේ කතෝලිකයන්ට ආරාධනා කිරීමට අපට අවශ්‍ය ය. මෙයින් ඔවුන්ට සුවයක් සහ කරුණාව ගෙන දිය හැකි ය.

සිදු කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳ ව මම සතුටු වෙමි. මෙම ආධ්‍යාත්මික පොත් පිංචේ ඇති සිතුවිලි අපට චතාරිකය සඳහා සූදානම් වීමට උපකාරී වේ. අපි මේ ආධ්‍යාත්මික ගමන ආරම්භ කරන විට, යුක්තිය ජය ගැනීමට පීඩිතයන්ට සහය දෙමු. එක් ව, මේ සඳහා අපට නිරන්තරයෙන් ධනාත්මක බලපෑමක් කළ හැකි ය.

මෙම පොත් පිංච සඳහා ඉරුදින මෙනෙහි කිරීම් සකස් කිරිමට සහාය දුන් සියලු ම පියතුමන්ලාට මම ස්තුතිවන්ත වෙමි. යුක්තිය උදෙසා අප යන ගමන සැම දෙනා තුළ බලාපොරොත්තුවක් ඇති කෙරේවා!

**ගරු ලූක් නෙල්සන් පියතුමා**

**ජාතික අධ්‍යක්ෂක**

**කරිටාස් ශ්‍රී ලංකා - සෙඩෙක් ආයතනය**

# අළු බදාදා

## 2024 පෙබරවාරි 18

- **පළමු දේව ප්‍රකාශනය : ජෝවෙල් 2:12-18**
- **දෙවන දේව ප්‍රකාශනය : 2 කොරින්ති 5:20, 6:2**
- **සුවිශේෂය : මතෙව් 6: 1-6, 16-18**

'දූවිල්ල' යනු මිනිස් ශරීරය නිර්මාණය කිරීම සඳහා යොදාගත් අමුද්‍රව්‍යය යි. විටෙක ආබ්‍රහම් තුමා දෙවි සමිඳාණන් ඉදිරියේ මෙසේ පවසයි. 'අළු හා දූවිල්ල' පමණක් වූ මා මාගේ ස්වාමීන් වහන්සේ සමග කතා කිරීමට තරම් නිර්භීත වීම ගැන මට සමාවන්න.' (උප්පත්ති.18:27) සර්ව බලධාරී මැවුම්කරුවාණන් ඉදිරියේ මිනිසාගේ දුර්වල බවේ දිග පළල කියන්නට ආබ්‍රහම් තුමන් යොදා ගන්නා සංකේතය වන්නේ ''අළු හා දූවිල්ල යි'' අනෙක් සියලු මැවිලි මෙන් ම මිනිසා ද අනිත්‍ය බව පැවසීමට මැවුම්කරුවාණන් ම යොදාගත් ප්‍රබල සංකේතය වන්නේ 'දූවිල්ල' යි.


'දූවිල්ලෙන් වූ ඔබ දූවිල්ලට ම යන්නේ ය. (උත්පත්ති 3:18) දූවිල්ලේ වැතිර සිටීම, දූවිලි ලෙව කෑම, හිස මත දූවිලි ඉසීම වැනි ක්‍රියා ශුද්ධ බයිබලය තුළ සංකේතවත් කරන්නේ ගැඹුරු නින්දාව අවඥාව හෝ විලාපය යි. (ජෝබ් 2:12. 42:6. යෙසායා 2:10. ගීතාවලිය 113:7)

දූවිල්ලෙන් සැදුණු මිනිස් සිරුරට ජීවය ලැබෙන්නේ දෙවියන් වහන්සේ එය තුළට ඇතුළු කරන උන්වහන්සේගේ ජීවන හුස්ම නිසා බව ශු. බයිබලය පවසයි (උත්පත්ති2:7). මිනිසාට දේව ස්වභාවය සහ ස්වරූපය උරුම වන්නේ එමඟිනි. මිනිස් ශරීරය තාවකාලික වුව ද දෙවියන් වහන්සේගේ ජීවන හුස්ම හෙවත් ආත්මය සදාකාලිකයි. පාපය ලෝකයට පැමිණෙන්නේ, තමන්ට සදාකාලික ජීවන හුස්ම ලබා දුන් මැවුම්කරුවාණන් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙනි. එමඟින් මිනිසා තමන්ට උරුම වූ දේව ස්වරූපය හා ස්වභාවය කෙළෙසා ගත්තේ ය. තම ජීවිතය ම දූවිලි බවට පත් කිරීමට සමත් මරණය තමා මත පටවා ගත්තේ ය. එමඟින් මිනිස් සංහතියට අහිමි වූ සදාකාලික ජීවිතය නැවත අත් පත් කොට දීමට දෙවි මහෝත්තමයාණන්ගේ එකම පුත්‍ර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට දුක් කන්දරාවක් විඳ අතිශය කෲර මරණයට පත් වන්නට සිදුවිය. ඒ ජීවිත පූජාව ඔස්සේ ලැබූ උත්ථානයේ අනුහසින් මිනිසාට නැවතත් සදාකාලික ජීවිතයේ උරුමය හිමි විය.

අළු බදාදායින් ඇරඹෙන චතාරිකය අපට යළි යළිත් මතක් කර දෙන්නේ මිනිස් ශරීරය සහ එය ඇතුළත් ලෞකික ජීවිතය ද 'දූවිලි' මෙන් ම කිසිදු වටිනාකමක් නැති තාවකාලික දෙයක් බවයි. ජීවන හුස්ම අපට ලබාදුන් මැවුම්කරුවාණන් ප්‍රතික්ෂේප කිරීමෙන් අප උරුමකරගෙන තිබෙන මරණයෙන් එතෙර වී නැවත සදාකාලික ජීවිතයට පංගුකාරයන් වීමට උත්ථානය අත්දැකිය යුතු බව ය. එය ළඟා කරගත හැක්කේ හුදෙක් පාපයට දුක් වීමෙන් පමණක් නොව සමස්ත ජීවිතය ම ආපසු හරවා ගැනීමෙනි. අද අප නළලත තැවරෙන අළු හෙවත් දූවිල්ල අපට පසක් කොට දෙන්නේ එම යථාර්ථය යි.

මිට වසර පහකට පෙර සදාකාලික ජීවිතය ලැබීමේ මහා මංගල්‍යය සැමරීමට දේවස්ථානයට පැමිණි අපගේ අහිංසක සහෝදර සහෝදරියන් 273 දෙනෙකුගේ ජීවිතය අලු දූවිල්ලක් බවට පත්කළ කුරිරු බෝම්බයේ නිර්මාපකයින් සැලසුම්කරුවන් සහ මහ මොළකරුවන් ඒ අපරාධය කළේ තාවකාලික ලෞකික බලයට ඇති කෑදරකම නිසා බව අපි දනිමු. ඔවුන් කළ මහා අපරාධයේ සත්‍යය ලෝකයෙන් සඟවා තබා ගැනීමට තම බලය සහ ධනය ප්‍රයෝජනයට ගනිමින් දරන උත්සාහය අසාර්ථක හා තාවකාලික බව අප විශ්වාස කරන්නේ 'සත්‍යය' වූ අප ගැලවුම්කරුවාණන් විසින් ම කිසියම් දිනෙක දී පාස්කු ඉරිදා ම්ලේච්ඡ ප්‍රහාරයේ සත්‍යය එළිදරව් කරන බවට ස්ථිර විශ්වාසයක් අපට ඇති බැවිනි.

**ගරු සිරිල් ගාමිණී පියතුමා**
**කොළඹ අගරදගුරු පදවිය**



# චතාරික සමයේ පළමු ඉරුදින

## 2024 පෙබරවාරි 18

- පළමුවන දේව ප්‍රකාශනය : උත්පත්ති 9:8-15
- දෙවන දේව ප්‍රකාශනය : 1 පේදුරු 3:18-22
- සුවිශේෂය : මාක් 1: 12-15

## අනේ අපි කවදාක හිනැහෙමු ද ඒ රටේ

***පිවිසීම***

පාස්කුව යනු එතෙරවීම යි. දෙවි මහෝත්තමයාණන් විසින් ඊශ්‍රායෙල් වැසියන් වහල් බවින් නිවහල් බව වෙත, රැගෙන යාම යි. වසරක් වසරක් පාසා ඔවුන් සිහිපත් කළේ නික්මයාම යි. ඒ සැමරුම තුළ ඔවුන් සිය අත්දැකීම අළුත් කර ගත් හ. කාලය ඉක්මවා යද්දී පාපී බව හේතුකොටගෙන පෙර පැවති වහල්කම ඔවුන් යළිත් අයිති කරගත් හ. ඔවුන් පමණක් නොව මුළු මහත් මිනිස් පරපුර ම ඇදී ගියේ එවන් වහල් ජීවිත රටාවකට යි.

නමුත්, බලපරාක්‍රම දෙවි මහෝත්තමයාණන්ගේ සුජාත කැමැත්ත වූයේ එය නොවෙයි. නව අහසක් හා නව පොළොවක් තුළ නව ජීවිතයක් උදාවෙනු දැකීම යි. ''අනේ, අපි කවදාක හිනැහෙමු ද ඒ රටේ'' යන්න ඔවුන්ගේ එකම සිහිනයයි. කිතුණු පරපුරක් ලෙස අපි අද ඒ දේව රාජ්‍යයේ අත්දැකීමට පිටුපා, වහල් බවින් දිවි ගෙවන, පාපතර ජනතාවක් බවට පත් වී ඇත. එම නිසා ඒ නව දේව රාජ්‍ය පතා කිතුණු අප ජීවිත පාද නමස්කාරයක් ඇරඹිය යුතු වන්නෙමු.

***මෙනෙහි කිරීම:***

ජේසුස් වහන්සේ පාළුකරයට පිවිසෙන්නේ ඒ ගමන දියත් කිරීමට යි. ඒ සඳහා ශක්තිය ගොනුකර ගැනීමට යි. (මාක් 1:12) ඊශ්‍රායෙල් වැසියන් වහල් බවින් මිදී, නව දේශයක් කරා ගමන් කළේ පාළුකරය මැදිනුයි.

ජේසුස් වහන්සේට ඒ ගමන සිහිවන්නට ඇති, දැනෙන්නට පටන්ග න්න ඇති, යළි ඒ ජනතාව වහල් බවට පත්වී ඇති අයුරු. ජනතාව තම වහල්කම හඳුනාගත්තේ නැත. හඳුනාගැනීමට නොහැකි වාතාවරණයක් ඔවුන් අවට ගොඩනැගී ඇත. ජේසුස් වහන්සේ පාළුකරයේ දී මේ වහල්

භාවය හඳුනාගෙන ඒ සමඟ පොරබදිමින්, තිරසාර ලෙස එය බැහැර කර ගත් සේක.

- අපි අපේ වහල්කම හඳුනා ගන්නවා ද? සමාජය විසින් ඉදිරිපත් කරන වටිනාකම් විසින් අප වහල්කර ඇති මග අපට වැටහෙනවා ද? හමන රැල්ලට හසු වී අපි මං මුලා වී ඇති වග අපට නොහැඟේ ද?

- මම දෙවිඳුන්ට ප්‍රසන්න වූ ජීවිතයක් ගත කරන පුතෙක් ද? දුවෙක් ද? නැතිනම් අතෘප්තිකර ආශාවන් පසුපස හඹායන්නට පෙළඹෙන තැනැත්තෙක් ද?
- බීමත්කම, විලාසිතා, මුදල් හදල්, උසස් අධ්‍යාපනය වැනි දේවල් නිසා, මම මාගේ ආත්මය විනාශ කරගෙන ඇත් ද?
- පක්ෂ, පාට, පගා, ගසා කෑම්, දුරාචාර නිසා දෙවිඳුන් මට දුන් අභිමානවත් ස්වරූපය පළුදු වෙන්නට ඉඩ හැරිය කෙනෙක් ද? මාගේ ස්වාමියාණන් දෙවියන් පමණක් වග පිළිගන්නා කෙනෙක් ද මම?
- ගම, රට, දේශය ගැන සිතන්නට, ඒ වෙනුවෙන් කැපවන්නට, නැඟී සිටීමට උර දෙන කෙනෙක් ද මම? නැතිනම් මගේ ජීවිත පැවැත්ම වෙනුවෙන් පමණක් ක්‍රියාශීලි වන ආත්මාර්ථකාමී පුද්ගලයෙක් ද?

මමත්වය ඉරාගත් මනුෂ්‍යත්වයෙන් පිරුණු ජේසුස් වහන්සේ තුළ ජීවත්වීම හා එතුමන් තුළ වූ දේව රාජ්‍යය වෙනුවෙන් දිවි පිදීම කිතුණු අපගේ පැතුම ද? (උපුටාගැනීම්ඃ ලන්දේ හඬ 'පාස්කුව' ප්‍රකාශනයෙන්)

***අධිෂ්ඨානයඃ***

"ක්‍රිස්තියානි විශ්වාසයේ හරය වන්නේ, ක්‍රිස්තුන් වහන්සේගේ කැඳවීම අනුව යමින් තම මමත්වය අතහැර උන්වහන්සේගේ අපරිමිත ප්‍රේමය තමන් තුළ ක්‍රියාත්මක කිරීමට ඉඩ හැරීමයි." (අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ නත්තල් පණිවිඩය)



**ගරු විලියම් ඉවාන්ස් පියතුමා**
**අගරදගුරු පදවිය - කොළඹ**

# චතාරික සමයේ දෙවන ඉරුදින
## 2024 පෙබරවාරි 25

- **පළමුවන දේව ප්‍රකාශනය : උත්පත්ති 22:1-2, 9-13, 15-18**
- **දෙවන දේව ප්‍රකාශනය : රෝම 8:31-34**
- **සුවිශේෂය : මාක් 9:2-10**

අද චතාරික සමයේ දෙවන ඉරුදින යි. අද දිනට නියමිත සුවිශේෂය අපට මතක් කර දෙන්නේ ජේසුස් වහන්සේගේ ජීවිතයේ සිදු වූ අන්‍ය රූප විලාශවීමේ සිද්ධිය යි. මතෙව්, මාක්, ලූක් යන සමදර්ශක සුවිශේෂ ත්‍රිත්වයෙහි ම දැකිය හැකි සිද්ධියකි, අන්‍යරූප විලාශවීමේ සිද්ධිය. මෙම සිද්ධිය මෙනෙහි කරන්නට චතාරික සමය ආරම්භයේදී ම ඇයි අපට ආරාධනා කරන්නේ? ජේසුස්වහන්සේගේ අන්‍යරූප විලාශවීමේ සිද්ධිය තුළ ගැබ්වෙන චතාරික පණිවුඩය කුමක්ද?

අන්‍යරූප විලාශවීමේ දී ජේසුස්වහන්සේ මරණින් පසු උදාවෙන ජයග්‍රාහී මොහොත අනාවරණය කරයි. නමුත් චතාරික සමය තුළ කිතුණු සම්ප්‍රදාය අපව හුරු පුරුදු කරන්නේ පශ්චාත්තාපයට යි, උපවාසයට යි, මර්දන ක්‍රියා කිරීමට යි. වෙනදාටත් වඩා ජ්වලිතමත් වූත්, ගැඹුරු වූත් පසන් ලතෝනි මගින් කෙරෙන යාච්ඤාවන්ට ය. එසේ බලන කල වැරදි අවස්ථාවක වැරදි ක්‍රියාවක් කෙරෙන ලෙසක් මෙම පාඨය අද දින මෙනෙහි කිරීම තුළ සිතෙන්නට පිලිවන. නමුත් සාන්ත සබාව අපට කියා දෙන්නේ ඊට හාත් පසින් ම වෙනස් වූ කාරණාවකි. එනම්, මේ චතාරික කාලයේ අපගේ ජීවිතයේ සියලු ම දුෂ්කර ක්‍රියා හා දයාවේ ක්‍රියාවන්ගේ අවසානය ආනන්දය බව යි. ජේසුස් වහන්සේගේ දුක්විඳීම හා මරණය අවසානයේ දී උන්වහන්සේගේ විජයග්‍රාහී උත්ථානය අනිවාර්ය විය. අන්‍යරූප විලාශවීමේ සිද්ධිය උන්වහන්සේගේ විජයග්‍රාහී උත්ථානයේ පෙර නිමිත්ත යි. මෙලෙස සාන්ත සබාව චතාරික සමයේ විශේෂයෙන්, සැමදා ජීවිතයේ සාමාන්‍යයෙන් අප විඳින දුක් ගැහැටවල අරුත අපට පෙන්වා දෙයි. දුක නිස්සාර නිෂ්ඵල දෙයක් නොව එය අරුත්බර ජයග්‍රාහණයක ක්‍රියා පිළිවෙතක් බව දැනෙන්නට සලස්වයි. ඒ නිසයි කවි පන්තියක මෙසේ කියවෙනුයේ "දුක්බර දිවියක අරුතක් ඇත මට ජය බිම සිකුරු නිසා."

අන්‍යරූප විලාශවීමේ සිද්ධිය සිදු වන්නට මත්තෙන්, සුවිශේෂක ගත් කතුවරු ක්‍රිස්තු ජීවිතයේ කුමන කරුණු සටහන් කරන්නේ දැ යි විමසා

බැලීම සුදුසු යැයි මෙහි දී පෙනී යයි. ඉන් ප්‍රධාන කරුණක් නම් පේදුරු තුමන්ගේ මහා ප්‍රකාශය යි. එනම්, ජේසුස්වහන්සේ ක්‍රිස්තුවරයාණන් ද, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ද බවත් ය. මේ මහා ප්‍රකාශයෙන් පසු ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට උන්වහන්සේ, සිය මරණය හා පුනර්ජීවනය ගැන කලින් ප්‍රකාශ කරයි. "උන්වහන්සේ බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මූලිකයන් ද, නායක පූජකයන් ද, විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නටත්, මරනු ලබන්නටත්, තෙදිනකට පසු නැවත නැගිටිනු ලබන්නටත් නියම බවයි." මෙය එදා ශ්‍රාවකයන්ට තේරුම් ගියේ නැත. ඔවුන් මෙවදන් අසා අතිශයින් ම කැළඹුනා පමණක් නොව මෙවැන්නක් කිසිසේත් ම සිදුවිය නොහැකි ලෙසට උන්වහන්සේට චෝදනා කළ හ. එවිට උන්වහන්සේ ඔවුන් අතර ප්‍රධානියා වූ පේදුරුට තරවටු කරමින් "සාතන් අහකට යව, නුඹ සිතන්නේ මිනිසුන් සිතන විදිහට මිස දෙවියන් වහන්සේ සිතන විදිහට නොවේ" යැයි පැවසුවේ ද අන්‍ය රූප විලාශවීමේ සිද්ධියේ අවසාන සිද්ධි සමුච්චය තුළ ය. ඇත්තට ම මේ සිද්ධීන්ගෙන් පසු තාබෝර් කන්ද මත, එදා මුහුණ හිරු මෙන් බැබලුන, වස්ත්‍ර ධවල වර්ණයෙන් කාන්තිමත් ව බැබළුන ජේසුට, උන්වහන්සේ හා කන්ද මුදුනට නැගි පේදුරු, ජුවාම් හා ජාකොබ් යන ශ්‍රාවක ත්‍රිත්වයේ ප්‍රතිචාරය වූයේ කුමක්ද? පළමුව බිය, දෙවනුව වදන් ය. "ගුරු දේවයෙනී අපට මෙහි සිටින්නට ලැබීම මහත් වාසනාවකි. අපි මණ්ඩප තුනක්, එකක් ඔබටත් (ජේසුස් වහන්සේටත්), එකක් මෝසෙස්ටත්, එකක් එළියාටත් සාදමු යි" යන්න යි.

මෙම ප්‍රතිචාරය අපගේ ජීවිතයේ සාමාන්‍ය තත්ත්වය විග්‍රහ කරන්නක්. මනුෂ්‍යයන් ලෙස තමන් පිළිගන්නා ඕනෑ ම තැනක, තමන්ට අභියෝග යක්, කරදරයක් නැති ඕනෑ ම තැනක රැඳෙන්නට අපි හරි ම කැමති යි. ඒ තමයි අපේ සැනසීම ගෙනදෙන නවාතැන. මේවායේ ආශ්වාදය විඳගන්නට විතරක් නෙමෙයි මේවා කවදාවත් අතහැර ගන්නට බැරි තරම් ඒවා අයිතිකර ගන්නටත්, එහි ම රැඳෙන්නටත් අපි උත්සහ කරනවා. ඒක නිසා ම තමයි, කොයි දේ වුනත් මෙහි "අපි මණ්ඩප තුනක් මෙහි සාදමු යි" කියා පවසන්නේ. චතාරික සමය අපට අතහරින්නට යැයි ආරාධනා කරන්නේ අපේ ඇල්ම, බැල්ම, ලැදියාවන්, පුද්ගලයන් හා දේවල් ය. අප තුළ තිබෙන ඇල්ම බැල්ම, අපේ කිතුණු ගමනෙන් අප ව ඈත් කරවනවා, වළක්වනවා. මොකක් ද අපේ කිතුණු ගමන? අන්‍යරූප විලාශවීමේ සිද්ධියේ දී මේ කිතුණු ගමන දෙවි පියාණන් වහන්සේ ම අපට මතක් කර දෙනු ලබනවා. "මේ මාගේ පුත්‍රයාණෝය, මොහුට සවන් දෙන්න." පියාණන්

වහන්සේ මතක්කර දෙන, මේ සිද්ධිය වන්නට මත්තෙන් ජේසුස් වහන්සේ අන්තිමට වදාළ වචන මොනවා ද? පෙන්වා දුන් කිතුනු ගමන කුමක් ද?

"යමෙක් මා අනුව එන්නට කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරා, මා අනුව ඒවා." මේ තුළින් උන්වහන්සේ අපට ආරාධනා කරන්නේ, මෙලොව අයිති කරගෙන, අත්නොහැර ඊට ලොල් ව ඉන්නට නොවෙයි. තන්හා ආශා පොදි බැඳගෙන කුරුස ගමන අත් හරින්නට නොවෙ යි. සැනසීම ගෙනදෙන මාර්ගවල ම රැඳී සිටින්නට නොවෙ යි. තමකම, (Egoism) නසාගෙන උන්වහන්සේ අනුසාර කරන්නට අපට ආරාධනා කරයි. අහසේ පක්ෂීන්ට කැදැලි ද, හිවලුන්ට බෙන ද, ඇතත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට හිස තබන්නටවත් තැනක් නොතිබුණා සේ, ආත්මාර්ථයේ බන්ධනයෙන් මිදී තමකම නසා ගන්නට ආරාධනා කරයි. අනුන්ගේ ගව මඩුවක ඉපදී, අනුන්ගේ සොහොන් ගෙයක තැන්පත් කරනු ලැබූ ජේසුස් වහන්සේ අපට පෙන්වා දෙන්නේ උපත කියන දොරටුවෙන් මෙලොව නම් වේදිකාවට පිවිස විපත කියන දොරටුවෙන් අප නික්ම යන තෙක් රඟ දක්වන වහල්භාවයේ ජීවිතයේ නිස්සාර බව යි. අන්‍යරූප විලාශවීමේ සිද්ධියේ ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය වූයේ කුමක් ද? කන්දෙන් බැස යාම යි. උන්වහසේ ඒ කන්ද බැස ගියේ කුරුස කන්ද තරණය කරන්නට යි. තාබෝර් කන්දෙන් බැස්සේ නැත්නම් අන්‍යරූප විලාශයෙන් ඉඟිකෙරුණු, විජයග්‍රාහී ආනන්දය නොතිබෙන්නට තිබුණා.

දෙවියන්වහන්සේ අපට දරාගන්නට බැරි කුරුසයක් දෙන්නේ නැත. කුරුසිය අවසානයේ පරාජයත් දෙන්නේ ද නැත. අප ව උන්වහන්සේ සදාතන ගැලවීම කරා නියත වශයෙන් ම ගෙන යන සේක. එබැවින් අපි ජේසුස් වහන්සේ තාබෝර් කන්දේ දී පමණක් නොව කුරුස කන්දේ දී ද අනුසාර කරමු.

**ගරු ඇලෙක් රෝයි ප්‍රනාන්දු පියතුමා**
**රදගුරු පදවිය - අනුරාධපුර**



# චතාරික සමයේ තෙවන ඉරුදින
## 2024 මාර්තු 3

- **පළමුවන දේව ප්‍රකාශනය : නික්මයාම 20:1-17**
- **දෙවන දේව ප්‍රකාශනය : 1 කොරින්ති 1:22-25**
- **සුවිශේෂය : ජොහාන් 2:13-25**

යුක්තිය යනු දෙවියන් වහන්සේට හිමි කොටස ලබාදීම සහ අසල්වැසියාට ඔහුගේ යුතුකම ලබා දීම යි. දෙවියන්ට හිමිවිය යුතු දේ දීම අපි ආගම සහ නමස්කාරය ලෙස හඳුන්වමු. මගේ අසල්වැසියාට ඔහුගේ යුතුකම ලබා දීම ඔහුගේ ආරක්ෂාව, නිදහස සහ ජීවිතය සහතික කිරීම යි (cf. CCC 1807) අසල්වැසියාට යුක්තිය යනු මට මනුෂ්‍ය ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සේ ම ඔහුට ද සමාජයේ එම ජීවිතය ම ඇති බව සහතික කිරීම යි. ආගමක්, භාෂාවක් හෝ වෙනත් දෙයක් මත පක්ෂග්‍රාහී විය නොහැකි ය.

අද දින පළමු කියවීමේ දක්නට ලැබෙන දස පනත (දස ආඥා) හරහා දෙවියන් වහන්සේ ඔහුට සහ අසල්වැසියාට මෙම යුක්තිය සහතික කරයි. පළමු ආඥා තුන සමන්විත වන්නේ දෙවියන් වහන්සේ කෙරෙහි යුක්තිය යි. දෙවියන් වහන්සේ තම තෝරාගත් සෙනඟට සෑම දෙයක් ම කර ඇති බැවින්, දෙවියන් වහන්සේ ඉල්ලා සිටින්නේ ඔවුන් දෙවිඳුන් පමණක් පිළිග නිමින් එතුමන්ට ප්‍රමුඛත්වය දීම යි.

ඉතිරි පනත් සමන්විත වන්නේ කිසිවකු බැහැර නොකර අසල්වැසියාට යුක්තිය ඉටුකිරිම පිළිබඳ දෙවියන් වහන්සේගේ සහතිකය යි. මෙම ආඥා මඟින් දෙමාපියන්ගෙන් පටන්ගෙන, විදේශිකයන් ඇතුළු තම අසල්වැසියා දක්වා, වහලුන් සහ සතුන් සමාජය තුළ සමාන හා නිසි සැලකිල්ලක් භුක්ති විඳීමට වග බලා ගත යුතු බව යි. දෙවියන් වහන්සේ තෝරාගත්තේ කිසිවක් නැති සෙනඟක් හට සියල්ල දීමට ය. එමනිසා, දෙවියන් වහන්සේ ඔවුන්ට උසස් ලෙස සැලකුවාක් මෙන්, සෑම කෙනෙකු ම තම අසල්වැසියාට ගෞරවයෙන් සැලකිය යුතු ය.

අපි මේවා ආඥා ලෙස හැඳින්වුව ද, ඒවා මිනිසාගේ යහපැවැත්ම සඳහා දෙවියන් වහන්සේගේ කරුණාවන්ත සැලැස්ම යි. දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වන්නේ මිනිසාට සමාජය තුළ සහ ලෝකය තුළ ප්‍රීතියෙන් ජීවත්

වීමට උපකාර කිරීම යි. අද පිළිතුරු ගීතිකාවේ අපි ස්වාමීනි, ඔබට සදාකාල ජීවනයේ පණිවිඩය ඇත කියා පවසන්නේ එබැවිනි.


අද දෙවන කියවීම තුළින් අපට වැටහෙන්නේ ක්‍රිස්තියානි ධර්මය හුදෙක් ප්‍රාතිහාර්යයන් සහ ප්‍රඥාව මත නොව යුක්තිය මත පදනම් වි ඇති බව යි. අවාසනාවකට මෙන් අදත් කිතුනුවන් ලෙස අපි ආශ්චර්යයන් පසුපස දුවන අතර අපි ආගමික යැයි සිතමු. අපි ශුද්ධ වු මිනිසුන් ලෙස පුදුම දේ කරන්නන් පසුපස දුවන්නෙමු. කිතුනුවන් වශයෙන් අපි විශිෂ්ට බුද්ධිමය හා තාර්කික කතාවල නියැලී සිටින අතර අපි ඥානවන්ත යැයි සිතමු. මෙය ක්‍රිස්තියානි ධර්මය නොවේ. ක්‍රිස්තියානි ධර්මය රඳා පවතින්නේ කුරුසියේ ඇණ ගසන ලද ජේසුස් වහන්සේ තුළ අප දකින යුක්තිය මත ය. දෙවියන් වහන්සේගේ කරුණාව සහ ඇදහිල්ල නොමැති ව කෙනෙකුට මෙම අභිරහස තේරුම් ගත නොහැකි ය. අප ව ජීවත් කරවීමට එතුමන් මිය ගියේ ය. කිතුනුවන් වශයෙන් අප ඉල්ලා සිටින්නේ තවත් ක්‍රිස්තුස් වහන්සේ ව අනුකරණය කිරීමට හෝ වීමට, තම අසල්වැසියාගේ ජීවිතය වෙනුවෙන් තම ජීවිතය පවා පූජා කිරීමට ය. යුක්තිය යනු මගේ ජීවිතය පවා පරදුවට තබා මගේ අසල්වැසියා වෙනුවෙන් සටන් කිරීම යි. ක්‍රිස්තියානි ධර්මයේ ඉල්ලීම මෙය යි. ශුද්ධවන්ත පුද්ගලයා ආශ්චර්යමත් කථිකයකු හෝ විශිෂ්ටයකු හෝ දේශකයකු නොවේ, එහෙත් තම අසල්වැසියා වෙනුවෙන් පෙනී සිටින තැනැත්තා ය.

අද දින ශුභාරංචියේ පවා ජොහන්තුමා අපට පවසන්නේ ජේසුස් වහන්සේගේ කාලයේ නමස්කාර කල ස්ථානය පවා වෙළෙඳපොලක් බවට පත් වූ ආකාරය යි. වෙළෙඳපොලක දී වැදගත් වන්නේ යුක්තිය නොව ලාභය යි. ජේසුතුමන්ට අවශ්‍ය වූයේ එම ස්ථානය සැමට යුක්තිය සහතික කරන නමස්කාර ස්ථානයක් කිරීම යි. මෙහි දී වැදගත් වන්නේ බාහිර ව්‍යුහයන් නොව කෙනෙකුගේ ආකල්ප ගොඩනැගීම යි. ජේසුස් වහන්සේ තමන් ව හඳුන්වන්නේ දේව මාළිගාව ලෙස යි. පාවුලුතුමන් පවසන්නේ සෑම ඇදහිලිවන්තයෙකු ම ශුද්ධාත්මයාණන්ගේ දේව මාළිගාවක් බව යි (cf: 1 Cor 6(19 – 20, Eph 2(21- 22) දෙවියන් වහන්සේට අප තුළ වාසය කිරීමට සහ අපගේ ආකල්ප දෙවියන් වහන්සේගේ මාර්ග මත පදනම් වීමට අප ඉඩ දෙන විට, අපි සමාජය තුළ යුක්තිය සහතික කරන අය බවට පත් වෙමු.

ආත්මාර්ථකාමීත්වය විසින් නිර්මාණය කරන ලද අවුල් ජාලයට ඉතිහාසය සාක්ෂි දරයි. දශක තුනකට ආසන්න කාලයක් පැවති යුද්ධය,

නොසැලකිලිමත්කම හේතුවෙන් සිදුකළ 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයට ඉඩ දුන් අය, වර්තමාන ආර්ථික අර්බුදය සහ අපට ඇති වූ සියලු කැරලිවල ප්‍රතිවිපාක විශේෂයෙන් අපේ රට අත්විඳින ලදි. අපේ ආදරණීය මාතෘ භූමියේ විටින් විට, සෑම පුරවැසියෙකු ම ලාංකීය පුතකු හෝ දියණියක ලෙස සලකන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට දේව භය නැති අය හරස් වී ඇත. ඉන්දියන් සාගරයේ මුතු ඇටය කඳුළු බිංදුවක් බවට පත් වී ඇත්තේ අප අතර සිටින ආත්මාර්ථකාමී අදහස් ඇති කිහිප දෙනෙකු විසින් ඇති කරන ලද මෙම තුවාල නිසා ඇති වූ වේදනාවෙන් හඬමිනි. යුක්තිය ඉල්ලා කෑගැසීම බිහිරි කන් මත වැටී ඇත. දොස් පැවරිය යුත්තේ කාට ද? ආරම්භ කළ යුත්තේ කොතැනින් ද? වෙනස ආරම්භ විය යුත්තේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන අප සැමගෙනි.

අද දින ශුභාරංචියේ පවසන්නේ 'ජේසුස් වහන්සේ ඔවුන් සියල්ලන් ම දැන සිටි නමුත් ඔවුන් කෙරෙහි විශ්වාස නොකළේ ය; එතුමන්ට කිසි ම මිනිසෙකු ගැන සාක්ෂි අවශ්‍ය නොවේ; මිනිසකු තුළ තිබූ දේ ඔහුට පැවසිය හැකි ය. අපේ බලාපොරොත්තුව දෙවියන් වහන්සේ කෙරෙහි ය. අපගේ ආකල්ප වෙනස් කරන ලෙස දෙවියන්ට යාච්ඤා කරන අතර ම, අපගේ නායකයන් යුක්තිය ඉටු කරනු ඇතැ යි අපේක්ෂා කිරීම වෙනුවට, අපගේ ම මට්ටමින් අපගේ මාතෘ භූමියේ සිටින සෑම කෙනෙකු ම අපගේ ම සහෝදර සහෝදරියන් ලෙස සලකා අපගේ ආකල්ප වෙනස් කරමු. අසාධාරණයට ලක්වූවන්ගේ ලේ, හැඬීම, කඳුළු අමතක නොවේවා. වින්දිතයින්ට යුක්තිය ඔවුන් ව නැවත ජීවනයට ගෙන එන්නේ නැත. නමුත් එය ජීවත්ව සිටින අයට ජීවිතය සහතික කරනු ඇත. අපි පසුතැවිලි වෙමු. මෙම කරුණාව පිරුණු චතාරික සමයේ දෙවියන් වහන්සේගේ මාර්ග අනුගමනය කරමු. මේ අනුව, අපගේ සමාජය සහ ලෝකය විශාල වශයෙන් පරිවර්තනය කිරීම සඳහා වැඩ කිරීමට පටන් ගනිමු. අපි දෙවියන් වහන්සේට සහ අසල්වැසියාට හිමි දේ දීමට පටන් ගනිමු.



**ගරු ඇල්වින් පීටර් ප්‍රනාන්දු පියතුමා**
**රදගුරු පදවිය - මහනුවර**

# චතාරික සමයේ සතරවන ඉරුදින
## 2024 මාර්තු 10

- **පළමුවන දේව ප්‍රකාශනය : 2 වංශාවලිය 36:14-16, 19-23**
- **දෙවන දේව ප්‍රකාශනය : එපීස 2:4-10**
- **සුවිශේෂය : ජොහාන් 3: 14-21**

"බැහැපත් වන්නට, ඔසවන්නට ඉඩ දෙන්න."

- ශ්‍රී කුරුසියට නමස්කාර කරමින් භාවනාවට ඇතුළුවන්න

**පිවිසීම**

- සති තුනක ගැඹුරු සූදානමක් තුළින් චතාරික සමයේ හතරවන සතියේ ජන වන්දනාවට ඇතුළු වෙමු.
- කතෝලික සභා සම්ප්‍රදායේ චතාරික සමයේ වත්පිළිවෙත් වන උපවාසය, දන්දීම සහ යාච්ඤාවලට අපි අවධානය යොමු කරමු.
- අපගේ දේශය තුළ වර්තමාන අර්බුදකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන දේශය සමග සැබෑ එතෙරවීමකට යොමු වෙමු.
- 2024 යෝජිත චතාරික තේමාව "යුක්තිය උදෙසා පීඩා විඳින්නන් සමඟ චතාරිකය" යන්නෙහි ගැඹුරු අර්ථයන්ට අපි වඩාත් සමීප වෙමු.

සමස්ත දේව වචනය තුළින් අපට කරන ආරාධනාව බැහැපත් වීම සොයා ඔසවනු ලැබීම ය. දෙවිඳුන්ගේ ප්‍රේමයේ සැලකිල්ල තුළින් ආලෝකයේ හැසිරෙමින් පාස්කු විමුක්තියට සහභාගි වීම ය. "එසවීම" යන්නෙන් අදහස් කරනුයේ මෝසෙස් සර්පයා එසවූ ලෙස ම (ගණන් කතාව 21:4-9) සංකේතාත්මක ව පාපිෂ්ඨ පොළොවෙන් විමුක්තියට ඔසවා පහතට නැමීමකි.

ඉහළින් ඇති සෑම දේ පොළොවට ඇද ගන්නා සේ ඔසවන්නා පොළොවෙන් සමුගැනීමක් සලකුණු කරයි. උප්පත්ති 40ට අනුව ඔසවනු ලබන්නන් ඉවත් කරනු ලබන්නේ ය. නව ගිවිසුමේ එසවීම යනු ශ්‍රී කුරුසයේ ජීවිත පූජාව වේ.

අදහාගන්නාට සදාතන ජීවිතයේ පොරොන්දුව ප්‍රකාශ කෙරේ. කුරුසයේ විජයග්‍රහණය කිසිවකින් වැළැක්විය නොහැකි ය. දෙවිඳුන්ගේ ප්‍රේමය හමුවේ අකීකරු සහ කැරලිකාර ලෝකය එලෙසින් ම ක්‍රියා කරනු ඇත. දේව පුත්‍රයාණන් වහන්සේ මාංශගතවීම උත්පත්ති 22 ට සමාන්තර ව ඒක ජාතක ප්‍රේමනීය පුත්‍රයාණන් පූජා කිරීම ය.

1 කොරින්ති 13 ට අනුව ප්‍රේමයට සියල්ල යටත් වී උසුලනු ලබන සේක. දේව පුත්‍රයාණන් වහන්සේ තුළ නොබිඳුණු ප්‍රේමය ප්‍රකාශ වන අතර ගැලවීමේ ද උතුම් මොහොත වනු ඇත.

එහෙත් විනිශ්චයන් අප ඉදිරියේ ඇත. එය ලෝකයට මුහුණ දීමකි. අඳුරේ ක්‍රියා අතහැර ආලෝකයේ දරුවන් වීම ය. එම වෙන් කිරීම හා විනිශ්චය හෙළා දැකීමක් වන්නේ ය. එම හෙළා දැකීමෙන් මිදීමට සත්‍යය අපගේ ගමන් මග වන අතර සත්‍යය සියල්ල නිදහස් කරයි.

**ක්‍රියාකාරී ජීවිතය**

අසත්‍ය හා දූෂණය රජයන වර්තමාන සමාජ පරිසරය තුළ අපගේ එසවීම හඳුනා ගනිමු. දෙවිඳුන්ගේ දැතින් අප අත්දකින එසවීම් තුළ සේවයට බැහැපත් වෙමු. ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේමය බෙදා දෙන්නට පිපාසිත ජනතාව හඳුනා ගනිමු. අඳුරේ ක්‍රියාවන්ට ශාප නොකර පහන් දල්වා පාස්කු විමුක්තියට ගමන් කරමු.

**පිළිවෙත් අවසානය**

කයදුෂ්කාර ප්‍රාර්ථනාව, මල් උයනේ යැදුම අපි උච්චාරණය කරමු. සත්‍යයේ හා ආලෝකයේ ක්‍රියාකාරකම යෝජනා කරමින් ඒ තුළ ක්‍රියා කරමු. ගැඹුරු ආත්මික සටනකින් කුරුසිය සමඟින් අප දේශය එතෙර කරවමු.

**ගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමා**
**රදගුරු පදවිය - හලාවත**



# චතාරික සමයේ පස්වන ඉරුදින
## 2024 මාර්තු 17

- **පළමුවන දේව ප්‍රකාශය : ජෙරමියා 31:31-34**
- **දෙවන දේව ප්‍රකාශය : හේබ්‍රෙව් 5:7-9**
- **සුවිශේෂය : ජොහාන් 12:20-33**

ගොක් කුරුසිය පුච්චලා අළු කුරුසියක් නළලේ ඇඳගෙන ආරම්භ කරපු දින හතළිහේ ශුද්ධානකාන්තිය දවසින් දවස, සතියෙන් සතිය අපව ගැඹුරින් ගැඹුරට රැගෙන යන එතෙරවීමේ සහ නික්මයාමේ අත්දැකීමේ තවත් එක් පියවරක් තබන්නටයි අපේ සූදානම. ගලන ගඟේ ගොදුරක් නොවී පාවෙන දිය රැල්ලෙ පරඬැලක් නොවී, උඩුගම් බලා පිහිනන්නට ස්වාමීන් වහන්සේ අද අපට දුක්ප්‍රාප්තියේ පෙර රසයක් කවමින්, ඈත සිට කුරුසියේ මරණය දකින්නට ආරාධනා කරයි.

කුරුසියට පයින් ගසා ඔටුන්නක සිහිනය දුටු පේදුරුලාට, දකුණේ සහ වම්පස අසුන් ගෙන දේව රාජ්‍යයට නොව ලෞකික රාජ්‍යයක සිහින දැකපු ජාකොබ්ලා, ජුවාම්ලා ව, කාසියේ වාසිය අගයමින් පසුම්බිය අතමිට මොලවන් හිටපු ජුදාස්ලා ව, සැකයේ ඇස් දෙකෙන් ජීවිතය විනිශ්චය කළ තෝමස්ලා ව, පෙනී පෙනීත් නොදැකපු, අස අසාත් නෑසුණු, දුර්වල ධීවර ගෝලයන් ව පිරිසිදු කිරීමෙහි ලා යථාර්ථවාදී කිරීමෙහි ලා ජේසුස් වහන්සේ භාවිතා කළ එක ම බලගතු ආයුධය තමන්වහන්සේ විඳින්නට යන දුක සහ ලබන්නට යන මරණය යි. මරණයෙන් මතු ජීවිතය යි. ආත්මාර්ථයේ දෑස් ඉදිරිපිට පරාර්ථයේ කුරුසිය, අහංකාරයේ සැලසුම් ඉදිරිපිට නිහතමානී කුරුසිය, කාසියේ වාසිය ඉදිරිපිට හිස් බවේ කුරුසිය, බිය සැක සංකා ඉදිරිපිට ඇදහිල්ලේ කුරුසිය දැක මෙනෙහි කරන්නට ජේසුස් වහන්සේ සිය ගෝලයන්ට පමණක් නොව අපට ද යළි යළිත් ඇරයුම් කරන සේක.

ලෝක මිම්මෙන් එහා ගිය නව චින්තනයක් ක්‍රිස්තුන් වහන්සේ අපට හඳුන්වා දුන් සේක. අන්තිමයා පළමුවෙනියා වන, අත්හැරීමෙන් ලැබෙන බව, මරණයෙන් ජීවනය ගලන බව මුළු ලෝකයට ම කියා දුන් ගුරුවරයා

ජේසුස් වහන්සේ ය. සිය ජීවිත පැවැත්මෙන් උන්වහන්සේ එය සහතික කළ සේක. පෙනෙන දෙයට වඩා ගැඹුරින් දැක අබ ඇටයක් තුළ සැඟවුණු මහ ගහක් ද, පව්කාර ස්ත්‍රියක් තුළ සැඟවුණු සාන්තුවරියක් ද, ධීවර සීමොන් තුළ සැඟවුණු පර්වතයක් වැනි අපෝස්තුළුවරයෙක් ද, අසුපිට හුන් සාවුල් තුළ සැඟවුණු ධර්මදූතික පාවුළු ද හඳුනා ගැනීමට උන්වහන්සේ අපට ආරාධනා කරන සේක. එවැනි ක්‍රිස්තු දෙනෙතින් ජීවිතය දකින්නට චතාරිකය අපට ඇරයුම් කරයි. ලෝක මිම්මෙන් ඔබ්බට ගිය ක්‍රිස්තු මිම්මෙන් ජීවිතය මනින්නට ඔබට මට අභියෝගයක් ඇත.

බීජය පොළවේ වැටී නොමළොත් නව ජීවිතයක් කිසිදා නොලැබෙන අභියෝගාත්මක සුභාරංචිය ඉදිරිපිට අප අද නතර විය යුත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ පරමාදර්ශය නිසාම ය. අහස් කුස පරදා මව් කුසේ පදිංචි වූ ජේසු සමිඳාණන් නව මසක් පෙකෙනි වැලෙන් එල්ලී ආරම්භ කළ මෙලොව ජීවිතය තුන් පැයක් කුරුසියේ එල්ලී අවසන් කරමින් ලොවට කියා පෑවේ බීජය නොමළොත් ජීවිතය නොලැබෙන බව යි.

එසේ නම් මරණය, ජීවිතය අපට කියා දෙන හොඳ ම ගුරුවරයා වන බව නොරහසකි. චතාරිකය අපට ඇරයුම් කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ මරණය දෙස බලා අපගේ ජීවිතය ගැන මෙනෙහි කරන්නට යි.

මීට අවුරුදු 475 කට පෙර ඇදහිල්ල වෙනුවෙන් සිය ජීවිතයෙන් වන්දි ගෙවූ මන්නාරමේ ප්‍රාණ පරිත්‍යාගීවරුන් ද තිස්වසරක යුද්ධයෙන් සහ පස්වසරකට පෙර පුපුරා ගිය පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් ''මරණය'' අපට කියා දෙන්නේ ''ජීවිතයේ'' සැබෑ අර්ථය නොවේ ද?

'නොමළොත් බීජ නුඹ'
'ලියලන්නේ කොහොම'
'රූස්ස ගස් මෙහෙම'



**ගරු ප්‍රසාද් හර්ෂන පියතුමා**
**කොළඹ අගරදගුරු පදවිය**

# ගොබ් ඉරුදින
## 2024 මාර්තු 24

- **පළමුවන දේව ප්‍රකාශය :** **යෙසායා 50:4-7**
- **දෙවන දේව ප්‍රකාශය :** **පිලිප්පි 2:6-11**
- **සුවිශේෂය :** **මාක් 14:1-15 : 47**

ශුද්ධවූ සතිය ආරම්භ කරන අප සැම මෙම ගොබ් ඉරුදින සමිඳාණන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා සමවැදෙමු. එසේ අප අවංක ප්‍රයත්නයක් නොයොදවා තවත් එක් සතියක් ලෙස මෙම ශුද්ධවූ සතිය ද ගෙවන්නේ නම් එය නමට පමණක් 'ශුද්ධවූ' සතියක් වනු ඇති. එලෙස ම උතුරු, නැගෙනහිර දශක තුනකට එහා ගිය යුද්ධයෙන් දුක් විඳි සැමව ද වසර 5 ට පෙර පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් දුක් විඳි සැමව ද සිහිකර යුක්තිය සාධාරණය ඔවුන් සැම වෙනුවෙන් ඉල්ලමින් ද දෙවි සමිඳුන් යදිමු. මෙදින විශේෂිත වූ තේමාවන් ද්විත්වයක් මෙනෙහි කරනු ලබයි.

- ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට ඇතුළු වීම
- ඔවුන් වහන්සේගේ දුක් විඳීම

ස්පාඤ්ඤ ජාතික ඒජේරියා නැමති කුලවත් කාන්තාවගේ දින පොතෙහි (Diary of Egeria), ඇය ජෙරුසලෙම් නගරයේ වන්දනාව සඳහා පැමිණි කාල වකවානුව තුළ (ක්‍රි.ව 381-384) අත්දුටු ජනවන්දනා පිළිවෙත් අපට මැනවින් විස්තර කරන්නී ය. ඇයගේ වාර්තාවන්වලට අනුව මෙකී කාල වකවානුව වන විටත් ශුද්ධවූ පාස්කුව සැමරීමට මත්තෙන් එළඹෙන ඉරිදා දින ජෙරුසලමේ සිටි කිතුණුවන් ඔලිව් කන්දට නැග, උදය වරුවේ දේව වචනය මෙනෙහි කොට, සවස් යාමය වන විට පාම් අතු හෝ ඔලිව් අතු රැගෙන පෙරහැරින් ජෙරුසලෙම් නුවරට ඇතුළු වූ බව අපට පෙනී යයි.

වර්තමානයේ ගොබ් අතු ආශීර්වාද කිරීම ප්‍රධාන දෙව් මැඳුරෙන් පිටත සිදු වන අතර, එහි දී මෙකී පිළිවෙත ඊශ්‍රායෙල්වරුන් 'හෝසන්නා' කියමින් බාහිරින් ක්‍රිස්තුන් වහන්සේ ව පිළිගැනීම අනුකරණය කිරීමක් නොව, අප විශ්වාසය තුළ ක්‍රිස්තු ශ්‍රාවකත්වය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමක් බව බැතිමතුන් වන අප ඉතා පැහැදිලි ව මතක තබා ගත යුතු ය. ගොබ් අතු මත ආසිරි පැන් ඉසීමෙන් අනතුරු ව ජනවන්දනා වසරට නියමිත (A,B,C) සුවිශේෂ පාඨය මුලසුන දරන පියතුමා විසින් කියවනු ලබ යි. දිව්‍ය පූජාවේ දී මෙදිනට නියමිත දුක්ප්‍රාප්ති සුවිශේෂ පාඨයන් ජනවන්දනා වසරට අදාළ ව කියවනු ලබයි. ක්‍රිස්තුන් වහන්සේගේ මහා ගැලවීමේ කර්තව්‍යය මෙනෙහි කරමින් ඔවුන් වහන්සේ වෙතට හැරෙමින් නව ජීවිතයක් අත්දකින්නට කිතුණු

ජනවන්දනාව බැතිමතුන් ව මෙහෙයවයි. චතාරිකයේ ඉරුදිනයන් පමණක් නොව සතියේ දිනයන්හී ද ප්‍රසාද ස්නාපන විශ්වාස ගැඹුරු කර ගනිමින් ඒ තුළ පාපයෙන් එතෙර වී ක්‍රිස්තු උත්ථානය සිය පෞද්ගලික ජීවිතය තුළ අත්දැකීමේ ආශාව ද පසක් කර දෙයි.

ගොබ් ඉරුදින කිතු සමිඳුන් රාජ තේජසින් ජෙරුසලමට පිවිසීමත් එම සතිය අවසාන වන දුක්ප්‍රාප්තියත් කියවනු ලැබීම පරස්පර විරෝධිතාවක් බාහිරින් මතු කළ ද සත්‍යවශයෙන් ම ලෞකික රාජකීයත්වයකට එහා ගිය ආධ්‍යාත්මික රාජ්‍යයක උදාව මෙම තේමාවන් දෙක අපට පැහැදිලි කරන්නේ කිතුණු ශ්‍රාවකයන් වන අපට ද ජීවිත ගමනේ අරුමය විශ්වාසයේ දෑසින් බලා කිතු සමිඳුන්ගෙන් ඉගෙන ගනිමින් කුරුසිය දරාගෙන ක්‍රිස්තු ජයග්‍රහණය අත් කරගැනීමට යි.

දුක්ප්‍රාප්තියේ එන විවිධ චරිත තුළ අප ජීවිත කතාව ද අඩු වැඩියෙන් දකින්නට දේව වචනය අපට ආරාධනා කරයි. කුරුසිය පසුපස යන මරියාවන් තුළ, නොහඳුනන බව කියන පේදුරු තුළ, අතහැර යන ගෝල පිරිස තුළ, පාවා දෙන ජුදාස් තුළ, අනීතික නඩු තීන්දුවක් දෙන පිලාත් තුළ, ජුදා නායක පූජකයන් තුළ, හා කෙළෙහි ගුණ නොදත් ජනතාව තුළ මාගේ ජීවිත කථාව ද ලියැවී ඇත. ඒ ඒ චරිත හරහා මාගේ ජීවිතයේ අඳුරු තැන් හඳුනා ගෙන පව් සමාව ලැබ සැබෑ ජීවිත වෙනසක් අත්දකිමින් ජේසු සමිඳුන් දිනා දුන් ඒ වරප්‍රසාදිත ගැළවීම මගේ කර ගැනීමට දේව වචනයත්, කිතුනු ජන වන්දනාවත් ඔබට මට ආරාධනා කරයි. ක්‍රිස්තු ජීවිත පූජාව ජයග්‍රහණයක් වනුයේ ඔබ මම එහි අයිතිකරුවන් වන තරමට ය. එවන් ජීවිත එතෙරවීමක් අත්දකින්නට ඔබට දෙවිඳු ආසිරි ලැබේවා!

අමතක ව යමින් තිබෙන ඇදහිල්ලේ විරුවන් වන පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට ද දශක තුනකට එහා ගිය යුද්ධයෙන් බැට කෑ අප සහෝදර සහෝදරියන්ට ද යුක්තිය සාධාරණත්වය ඉල්ලා මොර ගසමු, දෙවිඳුන් යදිමු.

**ගරු ඇන්ටන් ශ්‍රියාන් පියතුමා**
**රදගුරු පදවිය - රත්නපුර**



# මහ සිකුරාදා දින
## 2024 මාර්තු 29

- පළමුවන දේව ප්‍රකාශය : යෙසායා 52:13-53:12
- දෙවන දේව ප්‍රකාශය : හෙබ්‍රෙව් 4: 14-16, 5:7-9
- සුවිශේෂය : ජොහාන් 18: 1-19:42

අද අප ක්‍රිස්තු සමිඳුන්ගේ මරණය සිහිපත් කරමු. ජේසු සමිඳුන්ගේ උපත කුරුසගත මරණයකින් සනිටුහන් වීම අහම්බයක් නොවේ. දේව අභිමතය පරිදි පාපයෙන් සහ එහි විපාකයෙන් මුදවා ගැනීමේ විමුක්ති මෙහෙවර තෝරාගැනීම තුළ එවැනි කුරුසගත මරණයකට පත්වීම ස්වාභාවික ය. තම විමුක්ති මෙහෙවරේ අවසානය දුටු ජේසු සමිඳුන් සිය ශ්‍රාවයන් අමතා ''... තව දෙදිනකින් පාස්කු මංගල්‍යය පැමිණෙන බව ඔබ දන්නහු ය. මනුෂ්‍ය පුත්‍රයාණන් කුරුසියේ ඇණ ගසනු ලැබීමට පවාදෙනු ඇතැයි'' වදාළ සේක (මතෙව් 26:1-2). එකල නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ ද කායාපස් නම් මහා නායක පූජකවරයාගේ මන්දිරයට රැස් වී, 4 ජේසුස් වහන්සේ ප්‍රයෝග යෙන් අල්ලා මැරීමට කුමන්ත්‍රණය කළ හ. (මතෙව් 26:3-4)

ජේසුතුමාගේ කුරුසගත මරණය 'එතුමාගේ ජීවිතයට අර්ථයක් දුන්නාක් මෙන්' එතුමාගේ ජීවිතය එතුමාගේ මරණයට අර්ථයක් දුන්නේ ය. අප ද දේව අභිමතය පරිදි අපේ ජීවිතය මෙහෙවර තෝරාගත යුතු ය. එයට කැපවිය යුතු ය. එවිට අපේ මරණය එම ජීවිත මෙහෙවරේ කූඨප්‍රාප්තිය වනු ඇත. මෙලෙස අපට ද ජේසුතුමා මෙන් සදාකලික ජීවිතයකට උත්ථාන වීමේ භාග්‍යය භුක්ති විඳීමට හැකිවනු ඇත.

මේ චතාරිකය අපේ කිතුණු ජීවිතවල හැරවුම් ලක්ෂයක් කරගැනීමට අපි ආත්ම සෝදිසියකට පිවිසෙමු. මේ සඳහා එදා පාස්කුවේ චරිත කිහිපයක් සමග අපේ මෙදා චරිත සැසඳීමකින්, අපි මෙම ව්‍යායාමයේ යෙදමු.

- අපේ වාසිය, ලාබය තකා ජුදාස් චරිතය රගපාමින් අපේ කිතුණු වටිනාකම් පාවාදී නැත් ද?

- සත්‍යයට සාක්ෂි දැරීමෙන් මතුවිය හැකි පීඩනයට බියෙන් අපි පේදුරුතුමාගේ චරිතය රගපාමින්  බොරු සාක්ෂි දෙමින් සත්‍යයට පිටුපා නැත් ද?
- බලය, කීර්තිය රැකගැනීම සඳහා පිලාත් චරිතය රගපාමින් ව්‍යාජ ලෙස නිදොස්බව පෙන්වීමට අප අත සෝදාගෙන නැත් ද?
- අපේ බල අධිකාරීත්වය යොදමින් අන් අයට පීඩා කිරීමේ හෙරොද් රජු චරිතය අපි රඟ පා නැත් ද?

අද ශ්‍රී ලාංකීක ජනතාව වන අප මුහුණ දෙමින් සිටින අති පීඩාකාරී ඛේදවාචකය කොතරම් දරුණු ද? යුක්තිය ඉල්ලා මොරගසන ජනතා හඬට සවන් නොදෙන, යුක්තිය වෙනුවට අයුක්තිය රජ කරන අසංවේදී බලධාරීන්ගේ මුරණ්ඩුකම ඉදිරියේ දේව රාජ්‍ය වටිනාකම් වන යුක්තිය සහ සංහිඳියාව වෙනුවෙන් පෙනී සිටින දේව ජනතාව වන අපි අපේ හඬ අවදි කළ යුතු ය. වසර 5ක් ගෙවී ගියත් පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉටු වී නොමැත. උතුරු නැගෙනහිර යුද්ධයට මුහුණදුන් ජනතාවගේ ආදෝනාවල් එසේම ය. කාලය එළැඹ ඇත. අපි අපේ බෞතිස්ම දිවැසිවර වගකීම සාමූහික ව ක්‍රියාවට නංවමු. අප ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දයා කරුණාවෙන් පාපය පරාජය කළා මෙන් අප ද දයා කරුණාවේ ප්‍රතිපදාවෙන් අපේ පෞද්ගලික සහ සමාජ පාප පරදවමු. මෙය අපේ මෙවර පාස්කු අධිෂ්ඨානය කර ගනිමු.

**ගරු චාර්ල්ස් හේවාවසම් පියතුමා**
**රදගුරු පදවිය - ගාල්ල**

# පාස්කු ඉරුදින
## 2024 මාර්තු 31

- **පළමුවන දේව ප්‍රකාශය :** **ක්‍රියා 10:34, 37-43**
- **දෙවන දේව ප්‍රකාශය :** **කොලොස්සි 3:1-4 හෝ 1 කොරින්ති 5:6-8**
- **සුවිශේෂය :** **ජොහාන් 20:1-9**

## කලකිරුනු අය නැගිටුවීම මැරුණු අය නැගිටුවනවාට වඩා කෙතරම් අමාරු ද?

අද අපට ශු. ලූක් තුමා ගෙනහැර දක්වන්නේ ක්‍රිස්තුන්වහන්සේගේ උත්ථානයෙන් පසු සමිදාණන්වහන්සේගේ උත්පත්තියත් උත්ථානයත් ඇතුළු ව සිදු වූ සමස්ත සිද්ධි දාමයේ සාරාංශයක් යැයි කිවහැකි ය. එය එසේ වන්නේ ජෙරුසලෙමේ සිට එම්මාවුස් දක්වා ගිය සිද්ධියේ දී සිදු වූ සිදුවීම් මෙනෙහිකර බලන විට ය.

මුලින් ම අප දකින්නේ බලාපොරොත්තු කඩා වැටුණු සෙනගකි. ඔවුහු බලාපොරොත්තු බිඳී ඇතැ යි සිතන විටත්, ඇත්තට ම තිබුණේ වෙන කවරදාටත් වඩා කාගෙත් සෑම බලාපොරොත්තුවක් ම ඉහළින් ම ඉෂ්ට වී හමාර වී ය. එහෙත් ඔවුන්ට එය දැනුනේ නැත. ඊට හේතුව ඔවුන්ගේ බලාපොරොත්තු එකක්වත් ඉටු නොවීම නොව ඒවා ඔවුන් බලාපොරොත්තු වී තිබුණු රාමුවට අනුව සිදු නොවීම ය. එහෙත් ඒවා ඔවුන් බලාපොරොත්තු වුණාටත් වඩා හොඳ විදියට සිදු වී තිබුණි. එබැවින් අතිශයින් ප්‍රීති විය යුතු ව තිබූ ප්‍රේරිත පිරිස අන්තිම අසතුටින් පිරී, තිබුණු ප්‍රීතියක් පිරිහී, ගැඹුරින් ම කඩා වැටී, සිටිය තැනත් එපා වී, කම්පාවෙන් ඇලලී කලකිරී පිට ගමකට පිටත් වුණෝ ය.

උන්වහන්සේ වැටුණු විට මිනිසුන්ට මෙසේ වුණාට මිනිසා වැටුණු විට දෙවියන් වහන්සේට එහෙම වුණා ද? මිනිසාට එහෙම වෙද්දී උන්වහන්සේ මිනිසා ගැන බලාපොරොත්තු නැතිකරගෙන ඔහු ගැන කලකිරී ගියාද ? උන්වහන්සේ මිනිසා ගැන එසේ කළ යුතු ව තිබියදීත් එසේ නොකළේ ඊට හාත්පසින් ම වෙනස් දෙයක් නිසා නෙමේ ද? නැත්නම් උන්වහන්සේ මිනිසා ව අත්නැර ඔහු වැටුණු තැනට එන්න මනුෂ්‍යයකු වෙලා උපදිනවා ද?

එසේ උන්වහන්සේ කරද්දීත් මිනිසා උන්වහන්සේට කළේ උන්වහන්සේ දෙන බලාපොරාත්තුවටත් පයින් ගසා උන්වහන්සේවත් එල්ලා ඇණ ගහන එක නොවේ ද!

නමුත් දෙවියන්වහන්සේ කලකිරී දැන් ඉතිං මීට වඩා මට කරන්න දෙයක් නෑ කියා නිකම් සිටියේ ද?

උන්වහන්සේ එහෙමත් කරලා ඇණ ගැසූ පුතාවත් නැගිට්ටවලා, උන්වහන්සේ සමඟ සිටි වැටුණු අනිත් අයවත් නැගිටවන්න කටයුතු කරත්දීත්, තාම ඒ අය ඉන්නෙ නැගිට්ටුවත් නැගිටින්න කැමැත්තක් නැති තත්වයක නෙමේ ද? ඒත් උන්වහන්සේ ඔවුන් ගැන කලකිරිලා මුකුත් නොකර නිකම් ඉන්න සිතනවා ද? උත්ථාන වූ තැනැන්වහන්සේත් කෙසේ හෝ බලන්නේ උන්වහන්සේ පමණක් නැගිටීම නොව උන්වහන්සේ වගේ අනික් අයවත් නැගිට්ටුවන්න නොවි ද?

ඒත් අපි ඉන්නේ කාටවත් අපව නැගිට්ටවන්න බැහැ, අපි කාටවත් නැගිටින්න දෙන්නෙත් නෑ, අපි නැගිටින්නෙත් නෑ කියනවා වැනි ස්ථාවරයක නම් දෙවියන් වහන්සේටවත් කවදාවත් අපව නැගිට්ටවන්න පුළුවන් වෙයි ද? එම්මාවුස් ගමන අපේ සමස්ත ගැලවීමේ කතාවේ ම සමාලෝචනයක් යැයි මුලින් කීවේ අදටත් මිනිසා මුදන්න දෙවියන්වහන්සේ දරන උත්සහයට එවැනි ඉරණමක් අත්වී ඇති නිසා නෙමේ ද?

මනුෂ්‍යයා ව මුදවා ගැනීමට ඇති ලොකුම බාධාව මනුෂ්‍යයාගේ ම ඇල්මැරුණු ගතිය සහ කලකිරුණු ස්වභාවය නෙමේ ද? කලකිරී සියල්ල එපා වූ අය අද අප අතර පෙරටත් වඩා කොතරම් ද? ඔවුන් සිතන විධිවල හිර වී ගතකරන්නේ කෙතරම් මුළුගැන්වුනු පසුගාමී ජීවිත ද?

ඒ තත්ත්වයන්ගෙන් අත්මිදෙන්න බැරි ඔවුන්ගේ ජීවිතවල බලාපොරොත්තුවට ඉඩක් නැති නිසා නොවේ ද? මිනිස් අපේ හපන්කම් ගැන අපි කාටවත් ලොකු බලාපොරොත්තුවක් දල්වා ගන්න බැරි බව සැබෑ ය. එහෙත් අපේ එක ම බලාපොරොත්තුව දෙවියන් වහන්සේ කර ගෙන ජීවිතයට සුබවාදී ව මුහුණු දෙන්න, එම්මාවුස් බලා පලා ගිය අය යළි පෙරලා නිවෙස් බලා පැමිණීමෙන් අපට පූර්වාදර්ශයක් සපයන්නේ නැද්ද?

**ගරු සාගර ප්‍රිශාන්ත පෙරේරා පියතුමා**
**රදගුරු පදවිය - කුරුණෑගල**

# සමිඳුනි මා ඔබේ දෑතේ මැටි පිඩකි
# කැමති හැඩක් රුවක් තනන්න සමිඳේ

2019 අප්‍රේල් 21 වෙනි පාස්කු ඉරුදින මගේ ජීවිතය ම කුඩුපට්ටම් කර පොළවට ම සමතලා කර දැමූ දවසකි. මා පමණක් ඉතිරි කර මගේ දරුවන් සහ ස්වාමියා ඝාතනය කළ දිනයකි ඒ.

ජේසුනී ඔබවහන්සේ කුමක් ද මේ කළේ? ඇයි මෙවැනි විපතක් වන තුරු ඔබ බලා සිටියේ? කියා කෑගැසූ බව මතක ය. එදා පටන් මා ආ ජීවිතය ලෙහෙසි එකක් නොවී ය. මා තුළ අවිශ්වාසය, වෛරය, කළහකාරි බව මෙන් ම සිහිවිකල් වූ අවස්ථා බොහෝ පසු කළෙමි. දෙවිඳුන්ට වෛර කරන අතර ම නැවත එතුමන් ව සොයන්න ජපමාලයේ පිහිට කාටත් රහසේ මම සෙව්වෙමි. මෙවැනි විපතක් මා හට කළේ මන්ද? ඇයි මා පමණක් ඉතිරි කළේ? යන අභිරහස මම තාමත් නොදනිමි.

අපි වැනි අය වෙනුවෙන්, මා වෙනුවෙන්, යාච්ඤා කළ මාගේ යාළුවන්, පියතුමන්ලා, කන්‍යා සොහොයුරියන් බොහෝ ය. අප වෙනුවෙන් මැදිහත් ව සේවය කළ ආධ්‍යාත්මික පියතුමා අප වෙනුවෙන් ක්‍රියා කළ අන්දම තුළ නැවත වරක් මම මගේ විශ්වාසය ප්‍රශ්න කළෙමි. මම මෙවැනි දුකක් දරාගෙන තාමත් ජීවත්වන්නේ කෙසේ ද? ඒ තුළ ම මගේ ජේසු කෙරේ විශ්වාසය නැවත දළු දැමීමත් සමඟ මොකක්දෝ හිත පිරුණ ආලෝකයක් මා තුළ ජනිත වූ බව දනිමි. මම මගේ දරුවන්, ස්වාමියා ජේසු ළඟ සතුටින් බව විශ්වාස කරමි. ඔවුන් ජේසුගේ දුක් විඳීමේ කාර්යයට එකතු ව දැන් සතුටින් දිවි ගෙවන බව අදහමි. ශුද්ධවූ මරියාවන් ඉසිලූ දුක් ගින්න මෙනෙහි කරමි. ජපමාලය කියා මරියතුමියගෙන් මේ දුක දරාගෙන මා රැගෙන යන ලෙස ඉල්ලමි.

මම දැන් මෙතෙක් කල් නොදැනුණ ජේසුගේ ආදරය අත්දකිමි. කරදර බාධක අඩුවක් නොවුණ ද ජේසුගේ ආදරයේ ප්‍රීතියෙන් මගේ හදවත පිරී ඇති බව දැනෙනවා. නපුරු කුණාටු තුළින් මා රැගෙන ගොස් ජේසු පවරපු, මා තාමත් ඉටු නොකළ ඒ රාජකාරිය ජේසු සමිඳුන් තුළ ම සිට සොයමි.

*-පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ වින්දිතියකගේ අත්දැකීමක්-*

# අවසාන සටනේ දී දිව්‍යමය අත්දැකීම

ඒ කල්වාරියේ කිව නොහැකි දුක්ඛිත අවසන් දිනයන් ය. මරණ මංචකයේ දී පවා සිහි වන නිවස අහිමි වූ, පවුල අහිමි වූ, සිරුර තුළ ජීවිතය ගෙන ගිය දින අමතක කළ නොහැකි ය.


අතේ සහ ගෙලෙහි දරා සිටින ජපමාලය, වේදනාවේ අන්ධකාරයේ ශුද්ධ බයිබලයේ ආලෝකය යි. මේ අපේ ඇදහිල්ලේ ඇස් දෙක යි. මූලික පහසුකම් නැත, තුවාලයට බෙහෙත් කිරීමට බෙහෙත් නැත, ජීවිතය බේරා ගැනීමට සෙවණක් නැත, මළ සිරුර මිහිදන් කිරීමට තැනක් නැත. ජීවිතය හෝ මරණය වැනි තත්ත්වයක් තුළ, අප සමඟ ඉතිරි වූයේ යාච්ඤා සහ ඇදහිල්ල පමණ යි.

රජයේ නිලධාරීන් අප ව හැරදා ගියා. රාජ්‍ය නොවන සංවිධාන අප ව අතහැර දමා ගියා. ජේසුස් වහන්සේගේ ජීවිතය, නැවත නැඟිටීම සහ දෙවියන් වහන්සේගේ ප්‍රේමය දිරියක් ලෙස අප සමඟ ගමන් කළේ ය.

අපේ ගරු පියතුමන්ලා සහ කන්‍යා සොහොයුරියන් වෘකයන් අතරේ සිටින බැටළු පැටව් වගෙයි. අපි ඔවුන් තුළ ක්‍රිස්තුන් වහන්සේ ව සොයා ගත්තෙමු. ඔවුන්ගේ සහයෝගයෙන් මරිය මාතාව අපට හමු විය. ඔවුන්ගේ පැමිණීම අපව ශක්තිමත් කළා. දුක් විඳීමෙන් දුර්වල වූ යහපත් ජේසු සමිඳාණන් වහන්සේ මෙන්, ඔවුහු මෝසස් මෙන් අපගේ බර දැරූ හ. ඔවුහු අපට සවන් දුන් හ.

මෙයයි අපේ යුද අත්දැකීම මෙයයි අපගේ පාස්කු උත්සවය.

*-යුද ගැටුම්වල පීඩිතයකුගේ අත්දැකීමක්-*




**Published by Caritas SL-SEDEC**
**133, Kynsey Road, Colombo 08.**
**011 2691885, sedec@caritaslk.org**
**www.caritaslk.org** YouTube Facebook